# සුවිශේෂී හමුවීමක්

මම 1996 වනජීවී නියාමකවරයෙක් හැටියට වනජීවී දෙපාර්තමේන්තුවට බැඳුණේ. මම අවුරුදු 10 ක් 12ක් විතර  වනජීවී නියාමකවරයෙක් විදියට තණමල්විල අඩවිය හඳපානගල අඩවිය නුවරඑළිය ශ්‍රී පාද අඩවිය වගේ ස්ථාන රැසක සේවය කළා. පස්සේ අඩවි සහකාරවරයෙක් විදියට මට උසස්වීමක් ලැබුණා. ඉන්පසුව උඩවලව ජාතික වන උද්‍යානයේ මම සෑහෙන කාලයක් සේවය කළා 2016 මුල්කාලයේ ඉඳලා. උඩවලව ජාතික වන උද්‍යානය ප්‍රසිද්ධ කොළඹ ආසන්නයේ තියෙන වල්අලි බලන්න පුළුවන් ස්ථානයක් විදියට. මෙහි විශාල ජෛව විවිධත්වයක් තිබෙනවා. වල් බළල්ලු එහෙම ගොඩක් ඉන්නවා. නමුත් දිවියන් එසේත් නැත්නම් කොටි දුර්ලභයි. අපිට එහේ කොටි ගැන වැඩි හැඟීමක් තිබුණෙ නෑ.

නමුත් මට අරුම පුදුම සිද්ධියක් වුණා 2016 වසර අවසානයේ. මට  හැමදාම දෙසැම්බර් 31 වනදා ගෙදර ගිහින් ජනවාරි පළමුවැනිදා වැඩට එන පුරුද්දක් තිබුණා. නමුත් මේ අවුරුද්දේ මම හිතුවා වැඩ අධිකව තිබුණ නිසා ගෙදර යන්නේ නැතිව උද්‍යානයේම ඉන්නවා කියලා. එහෙම හිත හදාගෙන ඉද්දී මට බාල දරුවාගෙන් කෝල් එකක් ආවා තාත්තේ අයියා වැටිලා අත මොනවද වෙලා ලොකු ගෙඩියක් ඇවිත් කියලා. ඒත් එක්කම මට පුතාව බලන්න යන්න ඕන වුණා. ඒ නිසා මම පිටවීම අත්සන් කරලා බෑග් එකත් අරන් පාරට බැස්සා ගෙදර යන්න. කාර්යාලයයි මහපාරයි  අතර තියෙන්නේ  මීටර් 75ක් 100ක් වගේ කෙටි දුරක්. මේ පාර දෙපැත්තෙම එහා මෙහා පේන්නේ නැති ඝණ තේක්ක කැලයක් තිබුණේ. ඉඳලා හිටලා අලියෙක් ඉන්නවා ඇරෙන්න වෙන කිසිම සතෙක් ඒ ප්‍රදේශයේ දැකලා නෑ.

මම ගෙදර ගැන හිත හිතා ඉස්සරහට ගියා. මට පිටිපස්සෙන් ජීප් එකක සද්දයක් ඇහුණා. ඒ වෙලාවේ සංචාරකයෝ උද්‍යානය නරඹලා ආපහු එළියට යන වෙලාව. එතනින් ජීප් එකකට නැග්ගොත් තත්පර ගණනකින් හරි බස් එකක් අල්ලගන්න තියෙන අවස්ථාව වැඩිවෙන නිසා මම පස්ස හැරිලා බැලුවා ජීප් එකේ ඉඩ තියනව ද හිස් එකක් ද කියලා. නමුත් ජීප් එක සම්පූර්ණයෙන්ම විදේශිකයන්ගෙන්  පිරිලා තිබුනේ. නමුත් මම ජීප් එක දිහා බලන කොට දුටුවේ ජීප් එකේ රියදුරු මහත්තයා අතක් එළියට දාගෙන කෑ ගහනවා. ඒ වගේම විදේශිකයොත් ලොකු බයකින් කෑ ගහනවා. ක්ෂණිකව මම ඉස්සරහ බලනකොට මගේ කකුලට අඩි දෙක හමාරක් විතර දුරින් දැවැන්ත කොටියෙක්. ඌ අඩි පහමාරක් හයක් විතර දිගයි. මගේ කකුල ටිකක් දික් කළානම් කොටියාගේ ඇගේ වදින ගානට. මට ඒ මොහොතේ බියක් ඇති වුණා ද මොකක් ද හිතුණේ කියලා කියන්න බැරි හැඟීමක් ඇති වුණේ.

මම කොටි ඈත දැකලා තිබුණාට මෙතරම්ම ළඟින් දැකල තිබ්බේ නෑ කවදාවත්ම. හැබැයි ඒත් එක්කම කොටියා වේගයෙන් පැනලා ගියා. ජීප් එකේ හිටපු අය හිතන්න ඇත්තේ කොටියා මට පැන්නා කියලා වෙන්න ඇති. මම ඇතිවුණ හැඟීම අඩුවෙලා තවත් පියවර තුනක් විතර ඉස්සරහට ගියා. නැවත්ත ජීප් එකෙන් ලොකු සෝෂාවක් ඇසුණා. මම පස්ස හැරිලා බැලුවා මොක ද මේ මිනිස්සු ආයෙ කෑ ගහන්නේ කියලා. බලනකොට මගේ පිටිපස්සෙන් අඩි පහක් විතර දුරින් තවත් කොටියෙක්. ඌත් කලින් කොටියා දුවපු පැත්තටම පාර පනිනවා.

මට ඒ වෙලාවෙ හිතුණේ බැරිවෙලාවත් මේ කොටි මගෙ ඇඟට පැන්නා නම් මොක ද සිද්ධ වෙන්නේ කියලා. නමුත් එහෙම සිද්ධියක් නොවුණ එක ගැන මම සතුටු වෙනවා.

ඒ වෙලාවේ ජීප් එකේ හිටපු විදේශිකයෝ නම් ගොඩක් සතුටු වෙන්න ඇති උද්‍යානයේ සීමා මායිමෙන් බැහැරව කොටි දෙන්නෙක්ව දැකපු එක ගැන.

# අනිල් ජයන්ත විතානගේ මහතා



අනිල් ජයන්ත විතානගේ මහතා උපත ලබා ඇත්තේ අවිස්සාවේල්ල ප්‍රදේශයේ ය. කෑගල්ල තල්දුව බෞද්ධ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ඇහැළියගොඩ මධ්‍ය මහා විද්‍යාලයෙන් දී උසස්පෙළ සමත් විය. ඔහු සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් හදාරා ඒ ආශ්‍රිත රැකියාවක නිරත වූ අතර ඇත ඔහු තුළ වනජීවී දෙපාර්තමේන්තුවේ රැකියාවක් සඳහා තිබූ දැඩි කැමැත්ත නිසාම රැකියාව කරන අතරදී ම ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ තරුණ සත්වවේදීන්ගේ සංගමයට බැඳී එහි අධ්‍යයන කටයුතුවල නිරත විය. සතුන් සම්බන්ධ මූලික දැනුම ඔහු ලබා ඇත්තේ ඒ තුළිනි. සර්පයන් සම්බන්ධ වඩා පුළුල් දැනුමක් ද ලබා ගත්තේ ය. මේ අවධියේ දී ඔහු පුස්තකාලාධිපති පාඨමාලාව ද හැදෑරුවේ ය.

1996.06.24 වැනි දින තම ආසාව මුදුන්පත් කර ගනිමින් අනිල් විතානගේ මහතා වනජීවී නියාමකවරයෙකු ලෙස වනජීවී දෙපාර්තමේන්තුවට සේවය කිරීමට වාසනාවන්ත විය. පළමු වරට හඳපානගල අඩවියේ රැකියාව කිරීමට අවස්ථාව ලද ඔහු තණමල්විල නුවර එළිය වැනි දුෂ්කර ප්‍රදේශයන්හි ද රාජකාරී සිදුකර ඇත.

ගවේෂණාත්මක සහ පර්යේෂණාත්මක කටයුතු සම්බන්ධව වැඩි උනන්දුවක් දැක් වූ විතානගේ මහතා සිරිපාද අඩවියේ කුරු අලින්, සුදු ගෝනුන් හා ආවේණික පක්ෂීන් සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකර ඇති අතර නිල් වෙරළු ශාකයේ පැහැය නිල් බව සනාථ කිරීමට ද දායක වී ඇත.

සමනල අඩවියේ සිට උසස්වීමක් ලබා රන්ටැඹේ අභය භූමියට සේවය කිරීමට ඔහුට අවස්ථාව ලැබිණි. එහි දී ඔහු ලංකාවට හඳුන්වා දී තිබූ ඉතා දරුණු ආක්‍රමණශීලී ශාකයක් වන Polonia samantose ශාකය පෞද්ගලික අංශය මඟින් පැතිරවීම වැළැක්වීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව මඟින් නීති මඟට පිළිපන්නේ ය. තවමත් එම නඩුව අවසන් වී නැත. මේ හේතුවෙන් නකල්ස් රක්ෂිතය තුළට ද එම ශාකය ඇතුලුවීම වළක්වා ගත හැකි වී ඇත.

විතානගේ මහතාගේ බිරිඳ ගුරු මවක් වන අතර දියණියකගේ සහ පුතණුවකුගෙන් ද ඔවුන්ගේ කැදැල්ල සමන්විතව ඇත. තමා මෙන් ම තම දරුවන් ද වනයට සහ වන සතුන්ට ආදරය කරන බව විතානගේ මහතා පවසයි. වර්තමානයේ ඔවුහු අවිස්සාවෙල්ල මාදූළුවේ පදිංචිව සිටිති.

# උඩවලව ජාතික උද්‍යානය

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයට හා සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රිකයට මායිම් වන පරිදි පිහිටා ඇති උඩවලව ජාතික උද්‍යානය, වලවේ ගඟ සංවර්ධන යෝජනාක්‍රමය හේතුවෙන් වාසස්ථාන අහිමි වූ වන ජීවීන්ට රැකවරණය සැලසීම පිණිස සහ උඩවලව ජලාශයේ ජලාධර ප්‍රදේශය ආරක්ෂා කිරීමත් අරමුණු කර ගෙන 1972 ජුනි මස 30 වන දින වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලදී.




**උඩවලව ජාතික උද්‍යානයේ සිතියම**

ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ජාතික උද්‍යාන අතරින් කොළඹට ආසන්නව පිහිටා ඇති ජාතික උද්‍යානයක් ලෙස සංචාරක ආකර්ෂණය දිනා ගෙන ඇති මෙහි මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 30821 ක් වේ. බොහෝ විට තැනිතලා භූමි ප්‍රදේශයෙන් යුත් මෙහි අතරින් පතර පැන නැගුණු කඳු දැකිය හැකි ය. උතුරින් පිහිටා ඇති කල්තොට කඳු වැටිය සහ දියවින්න ඇල්ල උද්‍යානයේ සොභා සෞන්දර්ය තවත් වැඩි කරනු ලබයි.






**උඩවලව ජාතික උද්‍යානයේ පිවිසුම**

උඩවලව ජාතික උද්‍යානය පිහිටා ඇති භූමිය දිගු ඉතිහාසයකට උරුමකම් කියයි. ගජබා රජු විසින් නීලමහ යෝධයාට ලබා දුන් ගම්වරයක් ලෙසින් වලව මිටියාවතේ පිහිටි ඉතා සුන්දර කල්තොට ප්‍රදේශය ප්‍රචලිත ය. නීල මහ යෝධයා මෙම ප්‍රදේශයේ කෘෂිකර්ම කටයුතු කල බවට සාක්ෂි .ද වේ. උඩවලව ජාතික උද්‍යානය තුල පිහිටි සීනුග්ගල, මුවංපැලැස්ස හා නැබඩ අතීතයේ දී සරුසාර ගම්මාන ලෙස පැවැති ඇත. වෙහෙරමංකඩ හා වෙහෙරගොල්ල ප්‍රදේශයෙන් හමු වූ පෞරාණික ගල්කණු හා නටබුන් මගින් එම ප්‍රදේශයේ ජනාවාස පැවති බවට තහවුරු වේ.

උද්‍යානය තුලින් ගලා බසින ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ගංගාවක් වන වලවේ ගඟ හරස් කොට උඩවලවේ ජලාශය ඉදි කර ඇත. වර්ග කිලෝමීටර් 1,155 ක් පුරා ව්‍යාප්තව ඇති වලවේ ගඟ, සමනළ අඩවියෙන් ආරම්භ වී තවත් දියදහරා රාශියක් එක්කර ගනිමින් උඩවලව ජාතික උද්‍යානය හරහා ගලා බසිමින් එහි ජීවත් වන සතුන්ට අපූර්ව වූ පරිසර පද්ධතියක් නිර්මාණය කර ඇත. උඩවලව ජලාශයට අමතරව වලවේ ගංගාධාර සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉදි වූ චන්ද්‍රිකා වැව, සමනළ වැව සහ මවු ආර ජලාශය බිහි වීමේදී අවතැන් වූ වන සතුන්ට ද මෙම ජාතික උද්‍යානය මගින් වාසස්ථාන හිමි විය.

වියළි හා අන්තර් දේශගුණික කලාපයන්ට අයත්ව පිහිටා ඇති මෙම උද්‍යානයට ගිණිකොණ දිග මෝසම් මගින් ප්‍රධාන වශයෙන් වැසි ලැබේ. මෙහි වාර්ෂික වර්ෂාපතනය දළ වශයෙන් මි.මී 1524 ක් සහ සමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 32 ක් පමණ වේ. උද්‍යානයේ බටහිර පෙදෙසේ කොටසක් අන්තර් කලාපයට අයත් වන අතර, සාපේක්ෂව වැඩි වර්ෂාපතනයක් මෙම ප්‍රදේශයට ලැබේ. රත්නපුරයට ආසන්න මායිම් කලාපයේ තෙත් කලාපීය ලක්ෂණත්, මොරණාගලට අයත් මායිම් කලාපයේ වියළි කලාපීය ලක්ෂණත් පෙන්වයි. වර්ෂයේ පෙබරවාරි මාර්තු මාසවල කෙටි වියළි කාළගුණයක් පවතින අතර, ඇතැම් විට මෙම වියළි කාළගුණික තත්වය මැයි මැද සිට සැප්තැම්බර් අග දක්වා පවතී. සැප්තැම්බර් වන විට අන්තර් මෝසම් මගින් වර්ෂාපතනය ලැබේ. නොවැම්බර් සිට ජනවාරි මැද දක්වා කාලය තුල ඊසාන දිග මෝසම් සුළං මගින් වැසි ලැබේ. මීට අමතරව අප්‍රේල් සිට මැයි දක්වා කාලය තුල සංවහන වැසි ද ලැබේ. මැයි සිට ජූලි දක්වා සුලං හමන වේගය පැයට කිලෝමීටර් 5.9 සිට 6.3 දක්වා විචලනය වේ. වැඩිම සුළඟ ජූනි මාසයේ දී දැකිය හැකි ය.

උඩවලවේ ජාතික උද්‍යානයේ ප්‍රාථමික ද්විතියික වනාන්තර මෙන් ම විවෘත තෘණ භූමි , සැවනා තෘණ භූමි, පඳුරු වනාන්තර හා තේක්ක වගාවන් ද හමුවේ. ජාතික උද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත්කිරිමට පෙර මෙම ප්‍රදේශයේ පැවැතුණු හේන්ගොවිතැන් හේතුවෙන් ස්වභාවික වෘක්ෂලතා එළිපෙහෙලි වීම සිදු විය. මේ හේතුව නිසා අද වන විට උද්‍යානය තුල විවෘත තණ බිම් රාශියක් දැක ගත හැකි වේ.

උද්‍යානයේ පවත්නා ශාක විශේෂ සැලකීමේදී උස් ශාක ලෙස බුරුත, හල්මිල්ල, කළුවර, කොලං, මිල්ල, කෝන්, කුණුමැල්ල ආදිය දැකිය හැකි අතර ඖෂධීය වටිනාකමක් ඇති ශාක ලෙස නෙල්ලි හා බුළු හමු වේ. වලවේ ගඟ දෙපස කුඹුක් හා මැන්ඩෝරා යන ශාක ප්‍රමුඛ වේ. තෘණ භූමි ප්‍රදේශ වල මාන, ඉලුක්, පොහොන්, වැනි තෘණ වර්ග ද දමනීය වැනි පඳුරු ශාක ද වේ. වනසතුන් සඳහා යෝග්‍ය නොවන ගඳපාන හා කුරටිය යන ආක්‍රමණික ශාක උද්‍යානයට තර්ජනයක්ව ඇත.

උඩවලවේ ජලාශය සහ වලවේ ගඟ වසරේ මුළුල්ලේ වනසතුන්ට අවශ්‍ය ජලය ලබා දීමත් එම පරිසර පද්ධතියෙහි පවත්නා ආහාර සුලභතාවයත් හේතුවෙන් උඩවලව ජාතික උද්‍යානය තුල දළ වශයෙන් ආසියානු අලි 250 ක පමණ ගහණයක් දකින්නට ලැබෙන අතර අනෙකුත් සත්ව විශේෂ රාශියක් ද මෙහි ජීවත් වෙති.



**ආසියානු අලින්**

උද්‍යානය තුල හමුවන විශාල ක්ෂීරපායීන් අතරින් ගෝනා, තිත් මුවා, වල් ඌරා, වල් මී හරකා ප්‍රධාන වන අතර, හිවලා, කලවැද්දා, රිලවා, හාවා, වැනි කුඩා ක්ෂීරපායි සතුන් ද ජීවත් වෙති. බළල් පවුලට අයත් දිවියා, කොළ දිවියා, හඳුන් දිවියා යන සතුන් ද වලහා ද උද්‍යානය තුල හමු වේ. නමුත් මෙහි වලසුන් අඩු සංඛ්‍යාවක් සිටින බැවින් දැක ගැනීමට ඇති අවස්ථා ඉතා විරල ය. මීයන් වර්ග 05ක්, සර්ප විශේෂ 30 ක්, මුගටි විශේෂ 03 ක් සමනළ විශේෂ 50 ක් පමණ ද උද්‍යානය තුළ දී හමු වේ. උරග විශේෂ අතර කටුසු විශේෂ කිහිපයක් සහ හැල කිඹුලා, කබරගොයා හා තලගොයා වේ.

උද්‍යානය තුල හමුවන පක්ෂි විශේෂ අතර ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂීන් වන හබන් කුකුළා, රතු මුහුණැති මල් කොහා, අළු කෑදැත්තා, වලි කුකුළා විශේෂත්වයක් ගන්නා අතර පොරෝ දෑකැත්තා, තඹසේරුවා, ළය රන් බට ගොයා හා පෙරළි කොණ්ඩකුස්සා යන පක්ෂීන්ද දක්නට ලැබේ. උඩවලව හා මව්ආර ජලාශයන් ආශ්‍රිතව දියකාවුන් වැනි ජලජ පක්ෂීන් සුලබව දැකිය හැකි වේ.



**පක්ෂීන් සිටින දර්ශනයක්**





**පෙරළි කොණ්ඩකුස්සා**

මෙම ජාතික උද්‍යානයේ පිවිසුමට කොළඹ සිට ඇති දුර කි.මී. 165 ක් පමණ වේ. උද්‍යානයට කොළඹ සිට ළඟා විය හැකි පහසුම මාර්ගය වන්නේ, කොළඹ සිට රත්නපුර පැල්මඩුල්ල හරහා පැමිණ, පැල්මඩුල්ල - ඇඹිලිපිටිය මාර්ගයේ තිඹොල්කැටිය හංදියෙන් වමට ඇති තණමල්විල මාර්ගය ඔස්සේ

උද්‍යාන පිවිසුමට පැමිණීම වේ. උද්‍යාන පිවිසුම තණමල්විල මාර්ගයේ 07 වන කිලෝමීටර් කණුව ආසන්නයේ පිහිටා ඇත.

උඩවලව ජාතික උද්‍යානයේ තවත් සංචාරක ආකර්ෂණය දිනා ගත් ස්ථානයකි "ඇත් අතුරු සෙවණ". කැලයේ දී මව මගහැරීමෙන් හෝ මව මරණයට පත් වීමෙන් හෝ රංචුවෙන් මග හැරෙන කුඩා අලි පැටවුන් ගෙනවිත් හදා වඩා කැළයේ තනිවම ජීවත් වීමට හැකි වන ලෙසට පරිණත වන තුරු අලි පැටවුන් රැක බලා ගන්නා ස්ථානයක් ලෙස 1986 දි උඩවලව ජාතික උද්‍යානයට ආසන්නයේ " ඇත් අතුරු සෙවණ" බිහි විය. උඩවලව ජලාශය මත්තෙහි පිහිටා ඇති "අත් අතුරු සෙවණෙහි" හැදී වැඩෙන අලි පැටවුන්ගේ කෙළි සෙල්ලම් මෙහි පැමිණෙන ඕනෑම අයකුගේ නෙත් සිත් පැහැර ගනු ඇත.





**ඇත් අතුරු සෙවණේ අලි පැටවුන්**

උඩවලව ජාතික උද්‍යානය නැරඹීමට එන සංචාරකයින්ට පිවිසුම් කාර්යාලයෙන් ප්‍රවේශ පත්‍ර ලබා ගත හැකි අතර සංචාරකයින්ගේ පහසුව සඳහා උද්‍යානය තුළ වැඩි දියුණු කරන ලද මාර්ග පද්ධතියක් පිහිටා ඇත. වනාන්තරයේ රැඳී සිට කඳවුරු බිමක රාත්‍රිය ගත කර වනාන්තරයක අසිරිමත් වූ අත් දැකීම් විද ගැනීමට කැමැත්තක් දක්වන සංචාරකයින් වෙනුවෙන් ප්‍රංශදාර, අලිමංකඩ, පිළිමද්දාර, රැනගල, අලිකටුපැලැස්ස, හදගිරිය යන ප්‍රදේශයන්හි කඳවුරු බිම් ස්ථාපිත කර ඇත. මෙවැනි කඳවුරු බිම් ස්ථාපිත කර ඇත්තේ සුවිශේෂී භූමි භාගයක් තුල වීමෙන් නරඹන්නන්ට වනජීවී සම්පත විඳීමේ උපරිම අවස්ථාවත්, වනාන්තරයක ජීවත් වීමේ අද්විතීය අත්දැකීමත් තම ජීවිතයට එක්කර ගත හැක. සංචාරකයින් සඳහා සියළු පහසුකමින් යුත් සංචාරක නිවාස තිඹිරියගස්මන්කඩ, වෙහෙරගොල්ල, සීනුග්ගල, ගෝනවිද්දගල සහ පොකුණුතැන්න ප්‍රදේශයේ ඉදි කර ඇති අතර මෙහි නවාතැන් ගැනීම සඳහා කොළඹ පිහිටි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් වෙන් කරවා ගැනීම කලින් කරගත යුතු වේ.



ගෝනවිද්දගල සංචාරක නිවාස



තිඹිරියගස්මන්කඩ සංචාරක නිවාස



සංචාරක ජීප් රියක්

**උඩවලව ජාතික උද්‍යානය පිළිබඳව විස්තරයේ ඇති වෘක්ෂයන්ගේ නම් ලැයිස්තුව**

**உடவளவை தொடர்பான விளக்கத்தில் காணப்படும் மரங்களின் பெயர்ப் பட்டியல்**

**List of trees in the Udawalawa document**

| Sinhala Names | Tamil Names | English Names | Botanical Name |
|---|---|---|---|
| බුරුත | முதிரை | Satin wood | *Chloroxylon swietenia* |
| හල්මිල්ල | சாவண்டலை மரம் | Halmilla | *Berrya cordifolia* |
| කළුවර | கருங்காலி | Ebony | *Diospyros ebenum* |
| කොලොං | மஞ்சக்கடம்பு | Kolon | *Haldina cordifolia* |
| මිල්ල | காட்டு நொச்சி | Milla | *Vitex altissimia* |
| කෝන් | பூக்கம் | Kon | *Schleichera oleosa* |
| කුණුමැල්ල | கரிமரம் | Kunumella | *Diospyros ovalifolia* |
| නෙල්ලි | நெல்லி | Nelli | *Phyllanthus emblica* |
| බුළු | தான்றி | Bulu | *Terminalia bellirica* |
| කුඹුක් | வெண்மருது | Kumbuk | *Terminalia arjuna* |
| මැන්ඩෝරා | எருக்கலை | Mendora | *Hopea cordifolia* |
| මාන | மானா | Mana | *Cymbopogon confertiflorum* |
| ඉලුක් | தர்ப்பைப் புல் | Illuk | *Imperata cylindrica* |
| පොහොන් | நேப்பியர்ப்புல் | Pohon | *Pennisetum polystachion* |
| දමනීය | பலிசமரம் | Damaniya | *Grewia tiliifolia* |
| ගදපාන | உண்ணிச் செடி | Gandapana | *Lantana camara* |
| කුරටිය | சிறுநெல்லி | Kuratiya | *Phyllanthus polyphyllus* |

**උඩවලව ජාතික උද්‍යානය පිළිබඳව විස්තරයේ ඇති සතුන්ගේ නම් ලැයිස්තුව**

**உடவளவை தொடர்பான விளக்கத்தில் காணப்படும் விலங்குகளின் பெயர்ப் பட்டியல்**

**List of animals in the Udawalawa document**

| Sinhala name | Tamil name | English name | Scientific name |
|---|---|---|---|
| අලියා | யானை | Asian elephant | *Elephas maximus* |
| ගෝනා | மரை | Sambar | *Rusa unicolor* |
| තිත් මුවා | புள்ளி மான் | Spotted deer | *Axis axis ceylonensis* |
| වල් ඌරා | காட்டுப் பன்றி | Wild Boar | *Sus scrofa* |
| වල් මී හරකා | காட்டெருமை | Water buffalo | *Bubalus bubalis* |
| හිවලා | நரி | Golden jackal | *Canis aureus* |
| කලවැද්දා | ஆசிய மரநாய் | Toddy cat | *Paradoxurus hermaphroditus* |
| රිලවා | செங்குரங்கு | Toque Macaque | *Macaca sinica* |
| හාවා | இந்திய குழி முயல் | Indian hare | *Lepus nigricollis* |
| දිවියා | சிறுத்தை | Leopard | *Panthera pardus kotiya* |
| කොළ දිවියා | துரும்பன் பூனை | Rusty- spotted cat | *Felis rubginosa* |
| හඳුන් දිවියා | மீன்பிடிப் பூனை | Fishing Cat | *Prionailurus viverrinus* |
| වලහා | தேன் கரடி | Sri lanka Sloth bear | *Melurus ursinus* |
| වලි කුකුළා | இலங்கைக் காட்டுக் கோழி | Sri lanka junglefowl | *Gallus lafayetii* |
| හබන් කුකුළා | சின்னக் காட்டுக்கோழி | sri lanka Spurfowl | *Galloperdix bicalcarata* |
| රතු මුහුණැති මල් කොහා | செம்முகப் பூங்குயில் | Red faced malkoha | *Phaenicophaeus pyrrhocephalus* |
| අළු කෑදැත්තා | இலங்கை சாம்பல் இருவாய்ச்சி | Sri lanka Grey Hornbill | *Ocyceros gingalensis* |

| Sinhala name | Tamil name | English name | Scientific name |
|---|---|---|---|
| පොරෝ දෑකෑත්තා | மலபார் கறுப்பு வெள்ளை இருவாய்ச்சி | Malabar pied horn bill | *Anthracoceros coronatus* |
| තඹසේරුවා | சிறிய சீழ்க்கைச்சிரவி | Lesser whistling duck | *Dendrocygna javanica* |
| ළය රන් බට ගොයා | செம்மஞ்சள் மார்புடைய பச்சைப்புறா | orange breasted green pigeon | *Treron bicinctus* |
| පෙරළි කොණ්ඩකුස්සා | குடுமிப் பருந்து | Crested hawk eagle | *Nisaetus cirrhatus* |
| දියකාවා | சின்ன நீர்க்காகம் | Little Cormorant | *Phalacrocorax niger* |
| හැල කිඹුලා | சதுப்பு முதலை | Mugger crocodile | *Crocodylus palustris* |
| කබරගොයා | நீர் உடும்பு | Asian water monitor | *Varanus salvator* |
| තලගොයා | இந்திய உடும்பு | Land monitor lizard | *Varanus bengalensis* |

**සංස්කාරක -** දම්මිකා මල්සිංහ, අතිරේක ලේකම් (ව්‍යාපෘති) , වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**උද්‍යානය පිළිබඳව විස්තර -** හසිනි සරත්චන්ද්‍ර, ප්‍රධාන මාධ්‍ය නිලධාරි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**දෙමළ පරිවර්තනය -** ඒ.ආර්.එෆ්. රිෆ්නා, සංවර්ධන නිලධාරි, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**ඉංග්‍රීසි පරිවර්තනය (වාර්තාවන්) -** අසෝක පලිහවඩන, පරිවර්ථක, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**ඉංග්‍රීසි අනුවාදය (කථාව) -** තානුක මල්සිංහ

**වෙබ් අඩවි සැකසුම -** සී.ඒ.ඩී. ඩී.ඒ. කොල්ලුරේ, කළමණාකරන සේවා නිලධාරි, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**ඡායාරූප -** රෝහිත ගුණවර්ධන, මහේෂා චතුරානි පෙරේරා (අභ්‍යාසලාභී උපාධිධාරි), වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව